# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 අප්‍රේල් මස 17 වන දින

## II වන කොටස

# අතිරේකය

(2026.04.22 දින නිකුත් කරන ලදී)

**ජාතික පාරිසරික (සංශෝධන)**

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

පරිසර අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 274.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 6 වන වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ. [10 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ක) ඡේදය]

**3 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ (මෙහි මින් මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යම පරිසර අධිකාරියේ සාමාජිකයන් ගණන වැඩි කිරීම වේ.

**4 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පරිසර සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කිරීමට නියමිත තැනැත්තන්ගේ තනතුර/ තත්ත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

**5 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ සභාවේ හෝ අධිකාරියේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය වැඩි කිරීම වේ.

**6 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගැයීම, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට නඩු කටයුතු පැවරීම, නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම සහ නියමිත ක්‍රියාකාරකම් නියාමනය කිරීමට අදාළ කාරණා එකතු කිරීම වේ.

**7 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ පනත යටතේ යම් පළාත් පාලන ආයතනයක් මත නිකුත් කරනු ලබන යම් විධානයක් ක්‍රියාත්මක කරන ලෙස නියම කිරීම සහ එම විධානවලට අනුකූලව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අදාළ වන නෛතික දණ්ඩනයක් නියම කරනු ලබන බවට එම පළාත් පාලන ආයතනය වෙත දැනුම් දීම වේ.

**8 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් නියමිත ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමට පෙරාතුව පරිශ්‍ර නිශ්කාෂණයක් සඳහා විධිවිධාන සැලැස්වීම සහ දඩ මුදල වැඩි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**9 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ බලපත්‍රයක් නිකුත් කිරීමේ දී පරිසරයට සිදුවන හානිය අවම කිරීමට ගනු ලැබිය යුතු නිවැරදි කිරීමේ පියවර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**10 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇ වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

**11 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඈ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පරිසරයට අහිතකර ලෙස බලපෑ හැකි යම් කාර්මික ආපදාවක්, අධිකාරිය විසින් බලපත්‍රයක් අවලංගු කළ හැකි අතිරේක හේතුවක් වශයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

**12 වන වගන්තිය** : බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ කාලසීමාව තුළ දී යම් තැනැත්තකු විසින් යම් කටයුත්තක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අස්ථාවක දී, යම් බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ

අවලංගු කිරීමේ නියෝගයක් තහවුරු කිරීමේ අධිකරණ නියෝගයක් ඉල්ලා සිටීම සඳහා ක්‍රියාවලියක් හඳුන්වාදීම පිණිස මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 23ඇඅ වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

**13 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඉ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අභියාචනයක් සම්බන්ධයෙන් සහ දෙන ලද කාලසීමාව ඇතුළත එම අභියාචනය කඩිනමින් විභාග කර තීරණය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

**14 වන වගන්තිය** : මේ වගන්තිය මගින් පරිසරය සුරක්ෂිත කිරීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් IVඅඅ කොටස ( උපද්‍රවකාරී අපද්‍රව්‍ය කලමනාකරණය කිරීම), IVඅආ කොටස (රසායනික ද්‍රව්‍ය කලමනාකරණය කිරීම) සහ IVඅඇ කොටස (පරිසරයට මුදාහරිනු ලබන අපජලය පාලනය කිරීම) යන කොටස් ඇතුළත් කිරීම කරනු ලැබේ.

**15 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඌ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඩ මුදල වැඩි කිරීම වේ.

**16 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඔ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඩ මුදල වැඩි කිරීම වේ.

**17 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ග වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඩ මුදල වැඩි කිරීම සහ පරිසරයට තවදුරටත් සිදු විය හැකි හානි වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා විසින් ගනු ලැබිය යුතු නිවැරදි කිරීමේ පියවර සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

**18 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඩ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඩ මුදල වැඩි කිරීම වේ.

**19 වන වගන්තිය** : මේ වගන්තිය මගින් භූමි හෝ වායු කම්පනය මගින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා සහ උල්ලංඝනය කිරීම් සම්බන්ධ දඩ මුදල් සහ බන්ධනාගාරගත කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලබන 23ඩඅ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලැබේ.

**20 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23න වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ දඩ මුදල වැඩි කිරීම වේ.

**21 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ප වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් ක්‍රියාකාරකම් තහනම් කිරීම සඳහා අමාත්‍යවරයාගේ විෂය පථය පුළුල් කිරීම, අදාළ දඩ මුදල සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සහ බලපෑමට ලක් වූ තැනැත්තා වෙත වසා දැමීමේ නියෝගයක් ප්‍රදානය කිරීමට පෙරාතුව මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දී නඩු විභාගය සඳහා අවස්ථාවක් ප්‍රදානය කිරීම වේ.

**22 වන වගන්තිය** : 23ප වගන්තිය යටතේ තහනම් කරන ලද යම් නිෂ්පාදනයක් හෝ ද්‍රව්‍යයක් අත්අඩංගුවට ගැනීම හෝ තහනමට ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය පැවරීම සඳහා මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 23පඅ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

**23 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23අඅ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය පැවරීම වේ.

**24 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ව්‍යාපෘතියක් අනුමත කිරීමට පෙරාතුව නියමිත ප්‍රමිති සහ නිර්ණායකවලට අනුකූලව ක්‍රියා කිරීමේ ප්‍රමාණය සලකා බැලීම සම්බන්ධයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**25 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකාරිය විසින් ලබා දුන් යම් අනුමතයක්, කොන්දේසි උල්ලංඝනය කිරීම පදනම් කොට ගෙන අවලංගු කිරීම සම්බන්ධයෙන් ද, අතෘප්තියට පත් පාර්ශ්වයක් විසින් ලේකම්වරයා වෙත අභියාචනා කිරීම සම්බන්ධයෙන් ද විධිවිධාන සැලැස්වීම වේ.

**26 වන වගන්තිය** : මේ වගන්තිය මගින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියට පිළිවෙලින් 23උඋ, 23ඌඌ සහ 23ඒඒ අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ:-

(i) නියමිත ව්‍යාපෘතිවලට අදාළ වැරදි සම්බන්ධයෙන් වූ දණ්ඩන;

(ii) පාරිසරික බලපෑම් තක්සේරුවක් අවශ්‍ය වන ව්‍යාපෘති සම්බන්ධයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලසුම් භාරදීම; සහ

(iii) මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් අවශ්‍ය වන ව්‍යාපෘති සම්බන්ධයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත කාලීන වාර්තා භාර දීම.

**27 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් IVඇ කොටස (උපාය මාර්ගික පාරිසරික ඇගැයීම) අලුත් IVඉ කොටස (තෙත්බිම් සංරක්ෂණය), අලුත් IVඊ කොටස (නිෂ්පාදකයාගේ විස්තීරණ වගකීම), අලුත් IVඋ කොටස (වැරදි සහ දණ්ඩන) ඇතුළත් කරනු ලබයි.

**28 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ පරීක්ෂාවක් හෝ අධීක්ෂණයක් සඳහා යම් පරිශ්‍රයක් වෙත ඇතුළු වී එම පරිශ්‍රය අධීක්ෂණය කිරීම සඳහා අධිකාරිය සතු බලතල දීර්ඝ කිරීම වේ.

**29 වන වගන්තිය** : ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 24අඅ වගන්තිය ඇතුළත් කිරීමෙන් මේ වගන්තිය මගින් පරිසරයට සිදුවන හානිකර ප්‍රතිවිපාක පිළිබඳ වාර්තාවක් සපයන ලෙස ඉල්ලා සිටිමින් යම් රජයේ ආයතනයක් වෙත යම් කාරණයක් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය පැවරීම කරනු ලබයි.

**30 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24ආ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ IVඅ කොටස, IVඅඅ කොටස, IVඅආ කොටස සහ IVඅඇ කොටස යටතේ යම් නියමිත කටයුත්තක් සිදු කරන යම් තැනැත්තකු වෙත විධාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය ලබා දීම වේ.

**31 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 24ආආ අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මගින් පරිසරයට අහිතකර වන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

**32 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයක් උල්ලංඝනය කරමින් පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ඇතුළත සිදු කරන ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් දඩ මුදලක් අයකිරීම සහ බන්ධනාගාරගත කිරීමක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

**33 වන වගන්තිය**: අලාභ තක්සේරු කිරීම සඳහා සහ මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දී නඩුවක් පැවරීම මගින් වගකිව යුතු පාර්ශ්වයෙන් එම පිරිවැය අයකර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 24ඇඇ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබයි.

**34 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ වරදක් නිවැරදි කිරීම වේ.

**35 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකාරියේ නිලධරයන්, සාමාජිකයන් සහ සේවානියුක්තයන් රාජ්‍ය සේවකයන් විය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

**36 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 27අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් IVආ කොටස යටතේ වූ සියලු වැරදි සංඥෙය වැරදි ලෙස සලකනු ලැබිය යුතු බවට විධිවිධාන සලස්වනු ලැබේ.

**37 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකාරිය 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

**38 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, එය 27 වන වගන්තියට (IVඋ කොටස) කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**39 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 31අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි සඳහා විධිවිධාන ඇතුළත් කරනු ලබයි.

**40 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ අන්තරායදායක ද්‍රව්‍ය තහනම් කිරීම හෝ සීමා කිරීම පිළිබඳ සහ එම ද්‍රව්‍ය ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම පිණිස විධිවිධාන සැලැස්වීම වේ.

**41 වන වගන්තිය**: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඇතැම් යෙදුම් සඳහා අර්ථ නිරූපණ සැපයීම පිණිස විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී. - ඕ 48/2025

## 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2026 අංක    දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1980 අංක 47 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින් මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තියේ (1) වන උපගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> “(1) මධ්‍යම පරිසර අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුත්තේ ය.’’.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> “(1) පහත දැක්වෙන පරිදි අධිකාරිය සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත විය යුතු ය; එනම්-
>
> (අ) පරිසර විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු විය යුතු නිලබලයෙන් පත්වන එක් සාමාජිකයකු; සහ
>
> (ආ) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්; එනම්-

PL 15650 - 465 (2026/01)

(i) පරිසර කළමනාකරණ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් අවුරුදු දහයක ප්‍රවීණත්වයක් සහ සුදුසුකම් සහිත තැනැත්තන් තිදෙනකු; සහ

(ii) පරිපාලන ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පරිසර කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත එක් තැනැත්තකු.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (අ) ඡේදයේ සිට ආරම්භව (ණ) ඡේදය දක්වා වූ සියලු ඡේදවල “ජ්‍යෝෂ්ඨ නිලධරයෙක්” යන වචන වෙනුවට “ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක යම් නිලධරයකු” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ත) ඡේදයේ “ජ්‍යෝෂ්ඨ නිලධරයෙක්” යන වචන වෙනුවට “අධ්‍යක්ෂවරයකු” යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (න) ඡේදයේ “සාමාජිකයන් හත් දෙනකු; සහ” යන වචන වෙනුවට “සාමාජිකයන් හත් දෙනෙක්;” යන වචනය ආදේශ කිරීමෙන්;

(4) එම උපවගන්තියේ (ප) ඡේදයේ “දෙදෙනෙක්.” යන වචනය වෙනුවට “දෙදෙනකු;” යන වචනය ආදේශ කිරීමෙන්;

(5) එම උපවගන්තියේ (ප) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන්:-

"(ඛ) අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක නිලධරයකු;

(ම) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන කළමනාකරුවකුගේ නිලයට අඩු නොවන යම් නිලධරයකු;

(ය) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 58 වන වගන්තිය යටතේ පත් කරනු ලබන වන සංරක්ෂක ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන යම් වන සංරක්ෂකවරයකුගේ නිලයට අඩු නොවන යම් නිලධරයකු;

(අඅ) (469 වන අධිකාරය වූ) වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 68 වන වගන්තිය යටතේ පත් කරනු ලබන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන අධ්‍යක්ෂවරයකුගේ නිලයට අඩු නොවන නිලයක නිලධරයකු; සහ

(අආ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන අධ්‍යක්ෂවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක යම් නිලධරයකු.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (14) වන උපවගන්තියේ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) (අ) ඡේදයේ “දෙදෙනකු” යන වචනය වෙනුවට “තිදෙනකු” යන වචනය ආදේශ කිරීමෙන්;

(2) (ආ) ඡේදයේ “හත්දෙනකු” යන වචනය වෙනුවට “නවදෙනකු” යන වචනය ආදේශ කිරීමෙන්,

එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(ඌඅ) නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් නව ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් සහ වැඩසටහන් සම්බන්ධයෙන් හෝ දැනට පවත්නා ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් සහ වැඩසටහන්වලට සිදු කරන වෙනස්කම් සම්බන්ධයෙන් උපායමාර්ගික පාරිසරික ඇගයීම් පවත්වාගෙන යෑම නියම කිරීම;”;

(2) එම වගන්තියේ (එ) ඡේදයේ-

(අ) “නිර්දේශ” යන වචනය සඳහන් වන සෑම ස්ථානයක් සඳහාම “විධාන” යන වචනය ආදේශ කිරීමෙන්;

(ආ) එම ඡේදයේ (vii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(viii) අපද්‍රව්‍ය අවම කිරීම, අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීම, අපද්‍රව්‍ය වෙනත් ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම හෝ පිළියම් කිරීම, සැකසුම් කිරීම සහ අවසාන බැහැර කිරීම සම්බන්ධයෙන් වූ පියවර ඇතුළත්ව, ඝණ අපද්‍රව්‍ය, එහි වඩාත් වැඩදායී භාවිතය ප්‍රකාරව නිසි පරිදි කළමනාකරණය කිරීම;";

(ඇ) එම ඡේදයේ (viii) වන අලුත් උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(එඅ) මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත ප්‍රකාරව අධිකාරිය විසින් ලබා දී ඇති යම් විධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එම විධිවිධාන හෝ විධාන උල්ලංඝනය කරනු ලබන යම් පළාත් පාලන ආයතනයකට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු කටයුතු පැවරීම;";

(3) (ඩ) ඡේදයෙහි, "ක්‍රියාත්මක කිරීම." යන වචන වෙනුවට "ක්‍රියාත්මක කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ණ) ස්වාධීනව හෝ වෙනත් යම් තැනැත්තකු සමග සම්බන්ධ වී, නියමිත භාණ්ඩ

හෝ නිෂ්පාදන සම්බන්ධයෙන් වූ නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම;

(ත) අධිකාරියේ එකඟත්වයට යටත්ව, මේ පනත හැර වෙනත් පනතක සඳහන් විධිවිධාන යටතේ යම් බලපත්‍රයක් ප්‍රදානය කර ඇත්තේ යම් නියමිත කටයුත්තක් සඳහා ද, එම කටයුත්ත නියාමනය කිරීම සහ එම කටයුත්ත සිදු කිරීමේ දී මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය වන ආකාරයට එවැනි නියමිත කටයුත්තක යෙදී සිටින යම් තැනැත්තකුට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පැවරීම; සහ

(ද) වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ අධිකාරිය සතු කර ඇති යම් කාර්ය, කර්තව්‍ය හෝ බලතල ඉටු කිරීම, කිරීම හෝ ක්‍රියාත්මක කිරීම.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(3) අදාළ පළාත් පාලන ආයතනය විසින් මේ පනතේ විධිවිධාන හෝ (1) වන උපවගන්තිය යටතේ එයට ලබා දී ඇති යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක දී හෝ එවැනි විධිවිධාන හෝ විධානයක් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක දී, අධිකාරියේ සභාපතිවරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි සෑම

ඉල්ලීමක් ම අධිකාරිය වෙත ලබා දී ඇති විධානවලට අනුකූලව ක්‍රියාකරන ලෙස එම පළාත් පාලන ආයතනය වෙත උපදෙස් ලබා දෙන්නා වූ "බලාත්මක කිරීම සඳහා වූ විධානයක් ද" සහිතව සභාපතිවරයාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(4) පළාත් පාලන ආයතනයේ පාර්ශ්වයෙන් සිදු වූ බවට කියනු ලබන පැහැර හැරීම ඇත්ත වශයෙන් ම සිදුව ඇති බවට විමර්ශනයක් පැවැත්වීමෙන් පසුව මහෙස්ත්‍රාත්වරයා විසින් සෑහීමට පත්වන අවස්ථාවක දී, එම බලාත්මක කිරීමේ විධානයට අනුකූලව ක්‍රියාකරන ලෙස අදාළ පළාත් පාලන ආයතනය වෙත විධාන කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ය. එම නියෝගයෙහි එම අනුකූලව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය වන කාලසීමාව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) බලාත්මක කිරීම සඳහා වූ සෑම විධානයක් ම සාක්ෂිවල දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු අතර එහි සඳහන් කරුණු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(6) අදාළ පළාත් පාලන ආයතනය විසින් එවැනි නියෝගයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ අතපසු කරන අවස්ථාවක දී, එම ආයතනය මේ පනතේ 23 ඬඬ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) (මෙහි මින් මතු "නියමිත කටයුතු" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රයක් අවශ්‍ය වනුයේ යම් කටයුතු සඳහා ද එම කටයුතු,

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර එම කටයුතු පහත දැක්වෙන පරිදි වේ, එනම්-

(අ) අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ පිට කිරීම අන්තර්ගත වූ හෝ එම ප්‍රතිඵලය ඇතිකරන්නා වූ සහ එම බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ පිට කිරීම මගින් දූෂණය සිදුවන කටයුතු; හෝ

(ආ) අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ පිට කිරීම අන්තර්ගත නොවන හෝ එම ප්‍රතිඵලය ඇති නොකරන්නා වූ කටයුතු වුව ද, එම කටයුතු කරගෙන යාම මගින්ම පරිසරයේ වැඩදායී භාවිතය සඳහා අහිතකර වන කටයුතු.

(2) (අ) 2අ උපවගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන පරිශ්‍ර නිෂ්කාසනයකට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරි බලය යටතේ මිස; සහ

(ආ) නියම කරනු ලැබිය හැකි යම් නියම, කොන්දේසි සහ ප්‍රමිතීන් ප්‍රකාරව මිස,

යම් තැනැත්තකු විසින් කිසිදු නියමිත කටයුත්තක් පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

(2අ) යම් නියමිත කටයුත්තක් පවත්වාගෙන යෑමට අදහස් කරන යම් ඉල්ලුම්කරුවකු පරිශ්‍ර නිෂ්කාසනය සඳහා අනුමතයක් ලබා ගැනීම පිණිස ආරම්භයේ දී ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලීම එම පරිශ්‍රය පරීක්ෂා කර බලා නියමිත ආකාරයෙන් වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු වූ, තත්කාර්ය සඳහා නම් කර ඇති නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරල්වරයා විසින් හෝ ඔහු විසින්, බලය පවරන ලද නිලධරයා විසින්, එම වාර්තාව සලකා බලනු ලැබීමෙන් පසු, ලිඛිතව හේතු වාර්තා කර පරිශ්‍ර නිෂ්කාසනය සඳහා වූ ඉල්ලීම අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය යුතු ය.

(2ආ) පරිශ්‍ර නිෂ්කාසනය ලබාගෙන ඇත්නම් මිස යම් ඉල්ලුම්කරුවකු විසින් පරිශ්‍රයෙහි කිසිදු ඉදිකිරීමක් ආරම්භ කරනු නොලැබිය යුතු ය.

(2ඇ) සෑම පරිශ්‍ර නිෂ්කාසනය ම එම නිෂ්කාසන දින සිට මාස දොළහකට වඩා වැඩි නොවන කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය. තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මාර්ගයෙන් යම් පරිශ්‍ර නිෂ්කාසනයක් තවදුරටත් වූ මාස දොළහක කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.'';

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) ''මේ වගන්තියේ (2) වන උපවගන්තිය කඩකරමින් යම් නියමිත කටයුත්තක් කරන සෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට'' යන වචන වෙනුවට ''මේ වගන්තියේ

(2) වන උපවගන්තිය හෝ (2ආ) උපවගන්තිය කඩකරමින් යම් නියමිත කටයුත්තක් කරනු ලබන සෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී එසේ වරදකරු කරනු ලැබූ විට'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එහි (අ) ඡේදයේ ''රුපියල් දස දහසකට නොඅඩු'' යන වචන වෙනුවට ''රුපියල් පනස් දහසකට අඩු නොවන සහ රුපියල් මිලියන විස්සකට වැඩි නොවන'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආ වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ''නියම කරනු ලබන යම් ආකාරයන්ට, කොන්දේසිවලට'' යන වචන වෙනුවට ''කලින් කල නියම කරනු ලැබිය හැකි ආකාරයන්ට, නියමවලට, කොන්දේසිවලට'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්: එනම්-

''(3) නියමිත කටයුත්තක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේ දී, පරිසරයට සිදුවිය හැකි හානිය අවම කිරීම සඳහා සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීම පිණිස මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ගනු ලැබිය යුතු නිවැරදි කිරීමේ පියවර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින්, මේ වගන්තියේ අන්තර්ගත විධිවිධාන පිළිබඳ සැලකිල්ලට ගැනීමෙන් පසුව සහ ඉල්ලුම්කරු වෙත, නියමකර ඇති එවැනි නිවැරදි කිරීමේ පියවර සහ ආරක්ෂණ පියවර ගැනීම සඳහා හැකියාවක් පවතින බවට සෑහීමට පත්වීමෙන් පසුව, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) බලපත්‍රයක් ඉල්ලා සිටින හෝ බලපත්‍රයක් අලුත් කිරීමක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවකු වෙත, මේ කොටසේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා හෝ නියම කරනු ලැබිය හැකි එවැනි පියවර හෝ ආරක්ෂණ පියවර ගැනීම සඳහා හැකියාවක් නොමැති බවට විශ්වාස කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු වෙත හේතු පවතින අවස්ථාවක දී, එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර, තත්කාර්ය සඳහා හේතු දක්වමින් ස්වකීය ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවට ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇ වන වගන්තිය ඉවත් කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඈ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඈ වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

“බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම

**23ඈ.** මේ කොටස යටතේ යම් තැනැත්තකු වෙත බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක

දී සහ එම තැනැත්තා විසින් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන හෝ බලපත්‍රයේ යම් නියම, ප්‍රමිති සහ කොන්දේසි උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන අවස්ථාවක දී හෝ, බලපත්‍රය නිකුත් කරනු ලැබූ අවස්ථාවේ සිට ස්වභාවික සාධක නිසා හෝ අනායාකාර හේතුවක් නිසා අපද්‍රව්‍ය ලබන පරිසරය වෙනස් කර හෝ වෙනස් වීමකට භාජනය වී ඇති අවස්ථාවක දී හෝ, බලපත්‍රයක අධිකාරී බලය යටතේ පරිසරය වෙත අඛණ්ඩව අපද්‍රව්‍ය මුදාහැරීම, තැන්පත් කිරීම හෝ පිට කිරීම මගින් පරිසරය ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා අහිතකර බලපෑමක් සිදු විය හැකි හෝ සිදුව පවතින අවස්ථාවක දී හෝ, පරිසරයට අහිතකර බලපෑමක් සිදුවන හෝ සිදු වීමේ හැකියාවක් පවතින යම් කාර්මික අනතුරක් වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා අපොහොසත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් නියමයක් මගින් එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් සඳහා එම බලපත්‍රය අත්හිටුවීම හෝ එම බලපත්‍රය අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියට 23ඇඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම**

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 23ඇඇ වගන්තිය වශයෙන් බලාත්මක විය යුත්තේ ය.

**“අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද බලපත්‍රයක් සඳහා 23අ වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වීම**

**23ඇඇ.** 23ඇ වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් බලපත්‍රයක් අත්හිටුවා හෝ අවලංගු කර ඇති කාලසීමාව තුළ දී යම් තැනැත්තකු විසින් යම් කටයුත්තක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී, 23අ වගන්තියේ (3) වන සහ (4) වන

උපවගන්තිවල සඳහන් විධිවිධාන එම තැනැත්තා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතු ය.''.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඉ වන වගන්තියේ (2) වන උපවගන්තිය ආරම්භයේ දී "(1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අභියාචනය එම අභියාචනය ලැබීමේ දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය." යන වචන එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඉ වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඉ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස් ඇතුළත් කරනු ලබන අතර, එම කොටස් එම ප්‍රඥප්තියේ IVඅඅ කොටස, (23ඊ, 23ඊඅ, 23ඊආ, 23ඊඇ, 23ඊඈ වගන්ති), IVඅආ කොටස (23 ඊඉ වගන්තිය) සහ IVඅඇ කොටස (23 ඊඊ, 23 ඊඋ, 23ඊඌ වගන්ති) වශයෙන් බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට IVඅඅ, IVඅආ සහ IVඅඇ අලුත් කොටස් ඇතුළත් කිරීම

"IVඅඅ කොටස

**උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම**

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් බලපත්‍රයක් ප්‍රදානය කිරීම අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු බව

**23ඊ.** (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යනුවෙන් සඳහන් කරනු ලබන) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රභේද පිළිබඳ ලැයිස්තු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එවැනි නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන කාර්යපටිපාටි සහ නිර්ණායක අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ මිස; සහ

(ආ) නියම කරනු ලැබිය හැකි යම් නියම, කොන්දේසි, ප්‍රමිති හෝ වෙනත් නිර්ණායක ප්‍රකාරව මිස,

යම් පහසුකමක්, කර්මාන්තයක් හෝ වාණිජ ක්‍රියාකාරකමක් සිදු කරනු ලබන කිසිදු තැනැත්තකු විසින් එවැනි නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය උත්පාදනය කිරීම, හැසිරවීම හෝ කළමනාකරණය කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(3) (4) වන උපවගන්තියට යටත්ව, (2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා-

(අ) රුපියල් මිලියන විස්සකට වැඩි නොවන දඩ මුදලකට සහ වරද අඛණ්ඩව සිදු කිරීමේ දී, එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව එම වරද අඛණ්ඩව සිදු කරන එක් එක් දිනය සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහසකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුත්තේ ය;

(ආ) අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී (2) වන උපවගන්තිය යටතේ වූ

බලපත්‍රයක් ලබාගන්නා ලෙස ඒ තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුත්තේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා වරදකරු බවට පත් කරන ලද යම් තැනැත්තකු අධිකරණය විසින් තීරණය කරන ලද කාලසීමාව ඇතුළත බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව එම කටයුත්ත අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ තත්කාර්ය සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් සිදු කරනු ලබන නවතා දැමීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, අධිකරණය විසින්, එම තැනැත්තා බලපත්‍රයක් ලබා ගන්නා තෙක් සහ එසේ ලබාගන්නා ලද බලපත්‍රයේ පිටපතක් අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක්, එම පහසුකම, කර්මාන්තය හෝ වාණිජ ක්‍රියාකාරකම නවතා දැමීම සඳහා නියෝග කරනු ලැබිය යුතු ය.

(5) නියම කරන ලද යම් උපද්‍රවකාරී අපද්‍රව්‍යයක් උත්පාදනය කිරීමේ, හැසිරවීමේ හෝ කළමනාකරණය කිරීමේ යම් පහසුකමක්, කර්මාන්තයක් හෝ වාණිජ ක්‍රියාකාරකමක් පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභියා විසින්, අධිකාරිය නිශ්චය කරනු ලබන කාලසීමා තුළ දී සහ වාර ගණන් තුළ දී එම උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රභේදය සහ එම අපද්‍රව්‍යවල ප්‍රමාණය සහ ධාරිතාව අධිකාරිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොඅඩු දඩ මුදලකට හෝ

අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

කටයුතුවල යෙදී සිටීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සහ නියම කරන ලද උපද්‍රකාරී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම

**23ඊඅ.** (1) නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් ඉල්ලීමක් ලැබීමේ දී සහ නියමිත බලපත්‍ර ගාස්තු ගෙවීමේ දී, එම ඉල්ලීමෙහි නිශ්චිතව දක්වා ඇති කාරණා පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු සෑහීමට පත්වීමෙන් පසුව, බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය මගින්, (4) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති නිශ්චිත කරුණුවලට යටත්ව, උපද්‍රවකාරී අපද්‍රව්‍යවල නියම කරන ලද ප්‍රභේද උත්පාදනය කිරීම, එකතු කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, ප්‍රතිභාවිතය, නිෂ්කර්ෂණය, පිළියම් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, පිරිසැකසුම් කිරීම හෝ බැහැර කිරීම සඳහා අදාළ ඉල්ලුම්කරුට බලය පවරා දෙනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු සෑහීමට පත් නොවන අවස්ථාවක දී, ඔහු විසින් ස්වකීය තීරණය සම්බන්ධයෙන් හේතු දැක්වීමෙන් පසුව, (1) වන උපවගන්තියේ සඳහන් යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. මේ කොටස යටතේ ගන්නා ලද තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

(4) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම-

(අ) නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් විය යුතු ය;

(ආ) කලින් කල නියම කරනු ලැබිය හැකි යම් නියම, කොන්දේසි, ප්‍රමිති හෝ නිර්ණායකවලට යටත් විය යුතු ය;

(ඇ) බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, එම කාලසීමාව මාස දොළහකට වඩා වැඩි නොවිය යුතු ය; සහ

(ඈ) නැවත ඇගයීමකින් පසුව, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් අලුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම

**23ඊආ.** (1) මේ කොටස යටතේ යම් තැනැත්තකු වෙත බලපත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක දී සහ එම තැනැත්තා විසින් මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන හෝ බලපත්‍රයේ සඳහන් යම් නියම, කොන්දේසි, ප්‍රමිති සහ නිර්ණායක උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන අවස්ථාවක දී හෝ, බලපත්‍රය නිකුත් කරනු ලැබූ අවස්ථාවේ සිට අපද්‍රව්‍ය ලබන පරිසරය ස්වාභාවික සාධක නිසා හෝ අන්‍යාකාර හේතුවක් නිසා වෙනස් කර හෝ වෙනස් වීමකට භාජනය වී ඇති අවස්ථාවක දී හෝ, එම නියම කර ඇති උපද්‍රවකාරී අපද්‍රව්‍ය අඛණ්ඩව උත්පාදනය කිරීම, හැසිරවීම හෝ කළමනාකරණය කිරීම මගින් පරිසරය ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා අහිතකර බලපෑමක් සිදුවිය හැකි හෝ සිදුව පවතින අවස්ථාවක දී හෝ, පරිසරයට අහිතකර බලපෑමක් සිදුවන හෝ සිදු වීමට හැකියාවක් ඇති යම් කාර්මික

අනතුරක් වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා අපොහොසත්වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයකු විසින් නියමයක් මගින්, නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් සඳහා එම බලපත්‍රය අත්හිටුවීම හෝ එම බලපත්‍රය අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් බලපත්‍රයක් අත්හිටුවා ඇති හෝ අවලංගුකර ඇති කාලසීමාව තුළ දී යම් තැනැත්තකු විසින් යම් කටයුත්තක් අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී, එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් 23අ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වහාම නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ විද්වත් තාක්ෂණික කමිටුව

**23ඊඇ.** (1) නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා (මේ කොටසේ මින් මතු “කමිටුව” යනුවෙන් සඳහන් කරනු ලබන), විද්වත් තාක්ෂණික කමිටුවක් පත් කරනු ලැබිය යුත්තේ ය. එම කමිටුව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන සාමාජිකයන් ගණනකින් සමන්විත විය යුතු ය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

(2) නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට අදාළව අධිකාරිය විසින් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන යම් කාරණා

සම්බන්ධයෙන් අධිකාරිය වෙත උපදෙස් ලබා දීම කමිටුවේ කර්තව්‍ය විය යුතු ය.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

**23ඊඇ.** (1) අමාත්‍යවරයා විසින්-

(අ) උපද්‍රවකාරී සහ වෙනත් අපද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම සහ සංක්‍රාන්තිය; සහ

(ආ) උපද්‍රවකාරී සහ වෙනත් අපද්‍රව්‍යවලට අදාළව ආනයනකරු හෝ අපනයනකරු විසින් වාර්තා භාර දීමට,

අදාළ කාරණා නියම කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකුගේ ලිඛිත අවසරය නොමැතිව කිසිදු තැනැත්තකු විසින් යම් නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය හෝ වෙනත් අපද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම හෝ සංක්‍රාන්තිය මගින් ලබා ගැනීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ අන්තර්ගත විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන යම් ආනයනකරුවකු, අපනයනකරුවකු, හසුරුවන්නකු හෝ පහසුකම් සපයන්නකු ඇතුළු යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී-

(අ) ටොන් එකක් නොඉක්මවිය යුතු නැව් භාණ්ඩ තොගයක් සඳහා රුපියල් මිලියන එකකට වඩා නොඅඩු දඩ මුදලක්; හෝ

(ආ) ටොන් එකක් ඉක්මවන සහ ටොන් පහක් නොඉක්මවන යම් නැව් භාණ්ඩ තොගයක් සඳහා, ටොන් පහක් දක්වා වැඩිවන එක් එක් ටොන් එකක අතිරේක ප්‍රමාණයක් සඳහා රුපියල් මිලියන දෙකකට නොඅඩු දඩ මුදලක්; හෝ

(ඇ) නැව් භාණ්ඩ තොගය ටොන් පහක් ඉක්මවන අවස්ථාවක දී එක් එක් අතිරේක ටොන් එකක් සඳහා රුපියල් මිලියන තුනක් වූ දඩ මුදලක්,

මෙන්ම ඒ අනුව අදාළ වන වෙනත් යම් ගාස්තු ද සමග අනුපාතික පදනමක් මත අය කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් එම අපද්‍රව්‍ය මුල් රට වෙත ආපසු යැවීම සඳහා නියෝගයක් ලබා ගැනීමට මහෙස්ත්‍රාත්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අදාළ පිරිවැය එම වරදකරු බවට පත් වූ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(5) මේ කොටසේ කාර්ය සඳහා-

“පහසුකම” යන්නෙන් නියම කරන ලද අපද්‍රව්‍ය ප්‍රභේද උත්පාදනය කිරීම, රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, පිරිසැකසුම් කිරීම, පිළියම් කිරීම සහ බැහැර කිරීම සඳහා භාවිත කරන හෝ ආනුෂංගික වන යම් ස්ථානයක් අදහස් වේ;

“හැසිරවීම” යන්නෙන් නියම කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රභේද රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, නැවත භාවිත කිරීම, නිෂ්කර්ෂණය, පිළියම් කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම, පිරිසැකසුම් කිරීම හෝ බැහැර කිරීම අදහස් වේ;

“වෙනත් අපද්‍රව්‍ය” යන්නෙන්, 1989 උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශ සීමා හරහා ප්‍රවාහනය සහ එම අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම පිළිබඳ බාසල් සම්මුතියේ නිශ්චිතව දක්වා ඇති අපද්‍රව්‍ය අදහස් වේ.

IV අආ කොටස

## රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම

රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම සහ තාක්ෂණික උපදේශන කමිටුවක් පිහිටුවීම

**23ඊඉ.** (1) අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන (මෙහි මින් මතු “රසායනික ද්‍රව්‍ය” යනුවෙන් සඳහන් කරනු ලබන) රසායනික ද්‍රව්‍ය, රසායනික සංඝටක, රසායනික ද්‍රව්‍ය කාණ්ඩ හෝ රසායනික නිෂ්පාදනවල නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එවැනිම ආකාරයකින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එම ලැයිස්තුව අවශ්‍ය ආකාරයට කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් හෝ තත්කාර්ය සඳහා බලය පවරනු ලබන යම් නිලධරයකුගෙන් බලපත්‍රයක් ලබා ගැනීමට

නියමිත වන්නා වූ රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ කටයුතු අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. බලපත්‍රයක අධිකාරි බලය යටතේ මිස, කිසිදු තැනැත්තකු විසින් එවැනි නියම කරන ලද කිසිදු කටයුත්තක් පවත්වාගෙන නොයා යුතු ය.

(3) රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ ප්‍රමිති, කාර්යපටිපාටිය සහ නිර්ණායක අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(4) රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා (මෙහි මින් මතු මේ කොටසේ “කමිටුව” යනුවෙන් සඳහන් කරනු ලබන) තාක්ෂණික උපදේශක කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය. කමිටුව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් සාමාජිකයන් ගණනකින් සමන්විත විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා කමිටුවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(5) රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අධිකාරිය විසින් කමිටුව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් උපදෙස් සැපයීම කමිටුවේ කර්තව්‍ය විය යුතු ය.

(6) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් ලක්ෂ පහකට අඩු නොවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

IV අඇ කොටස

## පරිසරයට මුදාහරින අපජලය පාලනය කිරීම

**අපජලය මුදා හැරීමේ ගාස්තුව**

**23ඊඊ.** (1) මුදාහරිනු ලබන දූෂක ද්‍රව්‍ය පිළිබඳ සහ එමගින් පරිසරයට සිදුවන බලපෑම සැලකිල්ලට ගනිමින්, කර්මාන්ත ශාලාවලින් සහ වෙනත් මූලාශ්‍රවලින් මුදාහරිනු ලබන අපජලය ප්‍රමාණය සම්බන්ධයෙන් වූ නියමිත සූත්‍රය ප්‍රකාරව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අපජලය මුදාහැරීමේ ගාස්තුව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එම ගාස්තුව අය කිරීමේ කාර්යපටිපාටිය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින්, (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති අපජලය මුදා හැරීමේ ගාස්තුව අය කරනු ලැබිය යුතු ය.

**අපජලය මුදා හැරීමේ ගාස්තු සහ අයහාර ගෙවීම**

**23ඊඋ.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් 24 වන වගන්තිය ප්‍රකාරව, කර්මාන්ත ශාලාවක හෝ වෙනත් යම් මූලාශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත අපජලය මුදා හැරීමේ ගාස්තුව පිළිබඳ දැනුම් දිය යුතු වේ. එම දැන්වීම ලැබුණු දින සිට දින තිහක් ඇතුළත එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් එකී ගාස්තුව ගෙවා නිම කළ යුතු වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ එම නිවේදනය නිකුත් කර ඇත්තේ යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු වෙත ද එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් නියමිත කාලසීමාව තුළ දී එම

ගෙවීම සිදු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් අප ජලය මුදා හැරීමේ ගාස්තුවට අමතරව නියෝග මගින් නියම කරනු ලැබිය යුතු අධිභාරයක් ද පනවනු ලැබිය හැකි ය.

(3) පරිසරයේ යහපත පිණිස අධිකාරිය විසින් උචිත බවට සලකන ආකාරයට, පරිසරය වෙත මුදාහරිනු ලබන අපජලය ප්‍රමාණය වහාම අඩු කරන ලෙස, පාලනය කරන ලෙස හෝ වෙනත් දෙයකට යොමු කරන ලෙස අධිකාරිය විසින් කර්මාන්ත ශාලාවේ හෝ වෙනත් මූලාශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත විධාන කරනු ලැබිය යුතු ය. කර්මාන්ත ශාලාවේ හෝ වෙනත් මූලාශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු එම විධානයට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු අතර, එසේ ක්‍රියා කිරීම අපජලය  මුදා හැරීමේ ගාස්තු ගෙවීමට අමතරව විය යුතු ය. එම විධානය ක්‍රියාත්මක කර ඇති බවට අධිකාරිය විසින් සහතික විය යුතු ය.

(4) මේ කොටස යටතේ ගෙවනු ලබන සියලු ගාස්තු 5 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල වෙත බැර කරනු ලැබිය යුතු මෙන්ම, අප ජලය මුදා හැරීමට අදාළ යම් අලුත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ දැනට පවතින යම් ව්‍යාපෘතියක් වැඩිදියුණු කිරීම සඳහා එය පවත්වාගෙන යා යුතු ය.

(5) පාරිසරික තිරසාරත්වය සහතික කිරීම සඳහා පරිසරයට සිදුවන හානිය පාලනය කිරීම, අවම කිරීම හෝ නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරිය වෙත වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අධිකාරිය වෙත අයවිය යුතු ගාස්තු අයකර ගැනීමේ ක්‍රමය

**23ඊඖ.** (1) නියමිත කාලසීමාව තුළ දී යම් තැනැත්තකු විසින් අපජලය මුදා හැරීමේ ගාස්තුව ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී ලඝු කාර්යපටිපාටිය මගින් නඩු කටයුත්තක් ගොනු කර එම මුදල අයකර ගැනීම සඳහා ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(2) අපජලය මුදා හැරීමේ ගාස්තුව ගෙවීම හෝ අයභාරය ගෙවීම පැහැර හරිනු ලබන හෝ 23ඊඋ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වැඩි නොවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩ මුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඌ වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඌ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තියේ-

(අ) “වරදකරු කරනු ලැබීමේ දී” යන වචන වෙනුවට “නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) ඒ තැනැත්තා රුපියල් ලක්ෂයකට වඩා අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ ඉන්පසුව එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී, එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන සෑම එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් වූ දඩ මුදලකට යටත් විය යුතු ය.";

(2) එහි (4) වන උපවගන්තියේ "සති හයක" යන වචන වෙනුවට "සති හතරක" යන වචන ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඒ වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඒ වගන්තිය සංශෝධනය කිරීම

(1) "වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමේ දී-" යන වචන වෙනුවට "වරදක් කරන අතර, නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී එසේ වරදකරු කරනු ලැබීමේ දී-" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (අ) ඡේදයේ "රුපියල් දසදහසකට නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවන" යන වචන සහ "රුපියල් පන්සියයක" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක" යන වචන ආදේශ කිරීමෙන්.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ක වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ක වන වගන්තිය සංශෝධනය කිරීම

"(4) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා-

(අ) රුපියල් ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් මිලියනයකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ ඉන්පසුව එම වරද අඛණ්ඩව සිදු කිරීමේ දී එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව එම වරද සිදු කරන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහස බැගින් වූ දඩ මුදලකට යටත් විය යුතු ය;

(ආ) එම නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත අධිකරණය විසින් නියම කරනු ලබන ආකාරයට යම් නිවැරදි කිරීමේ පියවර ගැනීමට සහ දූෂණය මගින් පරිසරයට සිදුවන තවදුරටත් වූ හානිය වැළැක්වීමට සහ අධිකරණය විසින් නියම කරනු ලබන ආකාරයට පරිසරය යථා තත්ත්වයට පත් කිරීමට නියමිත වේ; සහ

(ඇ) එම කාලසීමාව අවසානයේ දී එසේ ගනු ලැබූ නිවැරදි කිරීමේ පියවර සම්බන්ධ ප්‍රමාණවත් සහ පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කිරීමට නියමිත වේ.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ජ වන වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද දඩයකට සහ ඒ වරද නොකඩවා කර ගෙන යනු ලබන වරදක්

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ජ වන වගන්තිය සංශෝධනය කිරීම

වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩවා කර ගෙන යනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් පන්සියයක දඩයකට ද යටත් විය යුතු ය.'' යන වචන වෙනුවට ''නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දී එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වඩා වැඩිනොවන දඩ මුදලකට සහ ඉන්පසුව එම වරද අඛණ්ඩව සිදු කරනු ලැබීමේ දී, එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන සෑම එක් එක් දිනයක් සඳහා ම රුපියල් පන්දහසක දඩ මුදලකට යටත් විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 23ජඅ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ජ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 23ජඅ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:-

''කම්පනය මගින් ඇතිවන දූෂණය

**23ජඅ.** (1) කිසිම තැනැත්තකු විසින් යම් කම්පනයක ප්‍රමාණය, තීව්‍රතාවය හෝ තත්ත්වය සම්බන්ධයෙන් මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි ප්‍රමිති හෝ සීමා කිරීම් යටතේ හැර අධික භූ හෝ වායු කම්පනයක් පිටවීමට කටයුතු සලස්වනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා-

(අ) රුපියල් එක් ලක්ෂයකට වඩා අඩු නොවන සහ රුපියල් මිලියනයකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ ඉන් පසු එම වරද අඛණ්ඩව සිදු කරනු

ලබන අවස්ථාවක දී, එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක දඩ මුදලකට යටත් විය යුතු ය; සහ

(ආ) පරිසරයට තවදුරටත් හානි සිදු වීම වැළැක්වීම සඳහා සහ පරිසරය වෙත සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, අදාළ කාලසීමාව ඇතුළත අධිකරණය විසින් නියම කරනු ලබන නිවැරදි කිරීමේ පියවර ගැනීම සඳහා සහ එම කාලසීමාව අවසානයේ දී එම නිවැරදි කිරීමේ පියවර පිළිබඳ ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ පිළිගත හැකි සාක්ෂි අධිකරණට ඉදිරිපත් කිරීම සඳහා එම තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ත වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ත වන වගන්තියේ (2) වන උපවගන්තියේ “යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද දඩයකට” යන වචන වෙනුවට “යම් තැනැත්තකු නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ ඉන් පසුව එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී, වරදකරු කරනු ලැබීමෙන් පසුව එසේ එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් බැගින් වූ දඩයකට” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ද වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ද වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) යම් ක්‍රියාවලියක්, ක්‍රියාකාරකමක්, වෙළඳාමක්, ගබඩා කිරීමක් හෝ කර්මාන්තයක් වෙනුවෙන් යම් නිෂ්පාදනයක් හෝ යම් ද්‍රව්‍යයක් නිපදවීම හෝ භාවිත කිරීම තහනම් කිරීම හෝ එවැනි යම් නිෂ්පාදනයක දී, ක්‍රියාවලියක දී, ක්‍රියාකාරකමක දී, වෙළෙඳාමක දී, ගබඩා කිරීමක දී හෝ කර්මාන්තයක දී භාවිත කරනු ලැබිය යුතු යම් ද්‍රව්‍යයක් නිශ්චිතව දැක්වීම;";

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "වරදකට වරදකරු විය යුතු ය." යන වචන වෙනුවට "වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් එක් ලක්ෂයකට වඩා අඩු නොවන සහ රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවන දඩ මුදලකට සහ එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන අවස්ථාවක දී, වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ එම වරද අඛණ්ඩව සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම දඩමුදල සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.";

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) (3) වන උපවගන්තිය යටතේ වරදකරු වන තැනැත්තකු නොකඩවා යම් තහනම් කිරීමක් උල්ලංඝනය කරන හෝ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියමයක සඳහන් අවශ්‍යතාවයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින් එම පරිශ්‍රය වසා දැමීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, අධිකරණය විසින් එම ක්‍රියාවලිය, ක්‍රියාකාරකම, වෙළෙඳාම, ගබඩා කිරීම හෝ කර්මාන්තය පවත්වාගෙන යනු ලැබුවේ යම් පරිශ්‍රයක් තුළ ද, එම පරිශ්‍රය වසා දමන ලෙස නියෝග කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 23දඅ වන වගන්තිය ඇතුළත් කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ද වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 23දඅ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"23ද වගන්තිය යටතේ තහනම් කරන ලද යම් නිෂ්පාදනයක් හෝ ද්‍රව්‍යයක් අත්අඩංගුවට ගැනීම හෝ තහනමට ගැනීම

**23දඅ.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින්, නිසි විමර්ශනයකින් පසුව, 23ද වගන්තිය යටතේ යම් වරදක් සිදුවී ඇති බවට හෝ සිදු වෙමින් පවතින බවට විශ්වාස කිරීමට හේතු පවතී නම් -

(අ) යම් පරිශ්‍රයක් තුළ යම් තහනම් කරන ලද නිෂ්පාදනයක් හෝ ද්‍රව්‍යයක් නිපදවනු ලැබ තිබේ ද යන්න හෝ නිපදවමින් පවතී ද යන්න විමසා දැනගැනීම සඳහා හෝ එම පරිශ්‍රය තුළ දී එවැනි යම් නිෂ්පාදනයක් හෝ ද්‍රව්‍යයක් යම් නිෂ්පාදනයක, ක්‍රියාවලියක, ක්‍රියාකාරකමක, වෙළඳාමක හෝ ගබඩා කිරීමක භාවිත කරනු ලැබ තිබේ

ද යන්න හෝ භාවිත කරමින් පවතී ද යන්න දැන ගැනීම සඳහා දවසේ ඕනෑම සාධාරණ වේලාවක දී එම පරිශ්‍රය වෙත ඇතුළු වී පරීක්ෂා කිරීම් සිදු කරනු ලැබිය හැකි ය; සහ

(ආ) යම් තහනම් කරන ලද නිෂ්පාදන හෝ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම හෝ තහනමට ගැනීම කරනු ලැබිය හැකි ය.

(2) අදාළ ලේඛන ද සමඟ (1) වන උපවගන්තිය යටතේ අත්අඩංගුවට ගන්නා ලද හෝ තහනමට ගන්නා ලද යම් තහනම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් එසේ අත්අඩංගුවට හෝ තහනමට ගැනීමේ දින සිට පැය විසිහතරක කාලසීමාවක් තුළ දී නිසි අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) තහනම් නිෂ්පාදන හෝ ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා වූ ආඥාවක් ලබාගැනීම පිණිස එම නිෂ්පාදන හෝ ද්‍රව්‍ය තහනමට ගෙන ඇති ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය පවතින මහෙස්ත්‍රාත්වරයා වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. මහෙස්ත්‍රාත්වරයා විසින් තමාට අවශ්‍ය බවට පෙනී යන විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව, වගකිව යුතු තැනැත්තාගේ පිරිවැය දැරීම යටතේ එම නිෂ්පාදන භාණ්ඩ හෝ ද්‍රව්‍ය විනාශ කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම සිදුකළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.”.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23අඅ වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23අඅ වන වගන්තිය සංශෝධනය කිරීම

"(2) (1) වන උපවගන්තියේ සඳහන් අනුමතය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලැබිය යුතු අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයෙන් ලබාගත යුතු වේ. එම පත් කිරීමට පෙරාතුව එම නියමිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය කිසිදු උනන්දුවක් නොමැති බවට හෝ කිසිදු අයුරකින් එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සැලකිල්ලක් නොදක්වන බව හෝ සම්බන්ධ වී නොමැති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්විය යුතු ය.

(3) අධිකාරිය යම් නියමිත ව්‍යාපෘතියක ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වශයෙන් ක්‍රියාත්මක වන අවස්ථාවක දී හැර, යම් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව පමණක් නියමිත ව්‍යාපෘතියක් අනුමත කරනු ලැබිය යුතු ය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආආ වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ආආ වන වගන්තිය සංශෝධනය කිරීම

"(3අ) අවස්ථාවෝචිත පරිදි, තමා වෙත ඉදිරිපත් කරන ලද මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව සඳහා අනුමතය ප්‍රදානය කිරීම පිළිබඳ සලකා බැලීමේ දී, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් මේ පනතේ 32 වන වගන්තිය සහ IVආ කොටස යටතේ නියම කර ඇති ප්‍රමිති හා නිර්ණායක සමඟ අනුකූලව ක්‍රියාකිරීමේ ප්‍රමාණය පරීක්ෂා කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඇඇ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) මේ කොටස යටතේ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත අනුමතය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී සහ එම අනුමතය ප්‍රදානය කර ඇත්තේ යම් කොන්දේසියක් මත ද, එවැනි යම් කොන්දේසියක් උල්ලංඝනය කරමින් එවැනි යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ක්‍රියාකර ඇති අවස්ථාවක දී, අධිකාරිය විසින් නියමයක් මගින් එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් සඳහා එවැනි යම් අනුමතයක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

(1ආ) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තිය යටතේ හෝ (1අ) උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින් හෝ අධිකාරිය විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, එම තීරණය නිවේදනය කිරීමේ දිනයට පසුව දින තිහක කාලසීමාවක් ඇතුළත එම තීරණයට එරෙහිව ලේකම්වරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි ය.";

(2) එහි (2) වන උපවගන්තියේ "එවැනි අභියාචනයක් මත අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට, "(1ආ) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද එවැනි අභියාචනයක් මත අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 23උඋ, 23ඌඌ සහ 23ඒඒ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඊඊ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 23උඋ, 23ඌඌ සහ 23ඒඒ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:-

"මේ කොටස යටතේ වැරදි

**23උඋ.**(අ) 23ආආ වගන්තිය යටතේ අනුමතයක් ලබා ගැනීමෙන් තොරව නියමිත ව්‍යාපෘතියක් කරගෙන යන;

(ආ) නියමිත ව්‍යාපෘතියක අවස්ථාවෝචිත පරිදි, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවකට හෝ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවකට අදාළව නොමඟ යැවීමට හැකි වූ තොරතුරු ඉදිරිපත් කරන හෝ අසත්‍ය හෝ වැරදි සහිත තොරතුරු සපයන;

(ඇ) නියමිත ව්‍යාපෘතිය සඳහා අනුමතය ලබා ගැනීමෙන් පසු 23ඉඉ වගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයේ පූර්ව ලිඛිත අනුමතයක් නොමැතිව ඒ නියමිත ව්‍යාපෘතියට පසුව යම් වෙනස්කම් සිදු කරන;

(ඈ) අවස්ථාවෝචිත පරිදි, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් හෝ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව එවැනි අනුමතයක් ලබා ගැනීමට පෙරාතුව නියමිත ව්‍යාපෘතියක යෙදෙන;

(ඉ) වරක් ලබා ගන්නා ලද අනුමතය පසුව අවලංගු කරනු ලැබූ නියමිත ව්‍යාපෘතියක් දිගටම කරගෙන යන;

(ඊ) (i) ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත අයතනය විසින් පනවන ලද නියමයන්ට අනුකූල නොවෙමින්; හෝ

(ii) 23ඉඉ වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අත්හැර දැමීමක් පිළිබඳව, ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයට ද, අවශ්‍ය අවස්ථාවල දී අධිකාරියට ද දැනුම් දීමට අපොහොසත් වෙමින්,

නියමිත ව්‍යාපෘතියක් අත්හැර දමන;

(උ) යම් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් යම් ව්‍යාපෘතියක් සඳහා අනුමතය ප්‍රදානය කරන ලද්දේ යම් නියම හෝ කොන්දේසි යටතේ ද, එවැනි නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරන,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු ව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

පාරිසරික බලපෑම් තක්සේරු කිරීම අවශ්‍ය වන ව්‍යාපෘතියක් සඳහා පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලසුමක් භාරදිය යුතු බව

**23උඋ.** (1) පාරිසරික බලපෑම් තක්සේරු කිරීමකට හෝ අවස්ථානුකූලව, මූලික පාරිසරික පරීක්ෂණයකට යටත්ව ඇති නියමිත ව්‍යාපෘතියක් කරගෙන යන යම් තැනැත්තකු විසින්, ව්‍යාපෘතිය අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමතය ප්‍රදානය කිරීමෙන් මාසයක් ඇතුළත පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ දී උද්ගත වන කළමනාකරණ ක්‍රියාමාර්ග පැහැදිලිව අර්ථ නිරූපණය කර ඇති බව සහ ක්‍රියාත්මක කර ඇති බව සහතික කිරීම පිණිස, මේ කොටස යටතේ පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලසුමක් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයට භාරදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලසුමේ සපයා ඇති කාර්යයන්වල ප්‍රගතිය ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයට වාර්තා කිරීම නියමිත ව්‍යාපෘතියක් කරගෙන යන යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු ය. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින් කලින් කලට ඉහත කී කළමනාකරණ සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කර බලා එහි නිසි ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමට පත්විය යුතු ය.

(3) මේ වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා “පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලසුම” යන්නෙන්, නියමිත ව්‍යාපෘතියක් කරගෙන යන තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු නිශ්චිත ක්‍රියාමාර්ග සඳහා නිර්දේශිත අවම කිරීමේ පියවර අවශ්‍ය කරන සම්පූර්ණ සැලැස්මක් අදහස් වේ.

මූලික පාරිසරික පරීක්ෂණයක් අවශ්‍ය වන ව්‍යාපෘතියක් සඳහා භාරදිය යුතු වාර්තා

**23ඡඡ.** (1) මූලික පාරිසරික පරීක්ෂණයකට යටත්ව ඇති යම් නියමිත ව්‍යාපෘතියක් කරගෙන යන යම් තැනැත්තකු අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයට වාර වාර්තා භාරදිය යුතු ය. ඒ තැනැත්තා 23ආආ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතයේ කොන්දේසි සම්පූර්ණ කරන බවට සහතික විය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර තුනකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට IVඇ, IVඉ, IVඊ සහ IVඋ යන අලුත් කොටස් ඇතුළත් කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23ඡඡ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස් ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස් ප්‍රධාන ප්‍රඥප්තියේ IVඇ කොටස (23ඔඔ, 23ඕඕ වගන්ති), IVඉ කොටස (23කක, 23ගග, 23ජජ වගන්ති), IVඊ කොටස (23ටට වගන්තිය), සහ IVඋ කොටස (23ඩඩ, 23සස වගන්ති) ලෙස බලපැවැත්විය යුතු ය:-

“IV ඇ කොටස

**උපායමාර්ගික පාරිසරික ඇගයීම**

උපායමාර්ගික පාරිසරික ඇගයීම

**23ඔඔ.** (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, සැලකිය යුතු පාරිසරික බලපෑමක්

ඇති විය හැකි යම් රජයේ ආයතනයක යම් ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් ඒවා පිළිගැනීමට හෝ ක්‍රියාත්මක කිරීමට පෙරාතුව, ඒවා සකස් කිරීමේ දී හෝ සංශෝධනය කිරීමේ දී උපායමාර්ගික පාරිසරික ඇගයීමකට යටත් විය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන ජාතික ආරක්ෂාව සම්බන්ධ සැලකිල්ලට ගත යුතු කරුණක් විසඳීමට හෝ ජාතික හදිසි අවස්ථාවක දී හව්‍යතා සැලසුමක් ලෙස සකස් කළ යම් ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් සඳහා අදාළ කරගනු නොලැබිය යුතු ය.

(2) එවැනි ප්‍රතිපත්ති, උපාය මාර්ග, සැලසුම් හෝ වැඩසටහන් සකස් කරන හෝ සංශෝධනය කරන අදාළ රාජ්‍ය ආයතනය විසින්, සැලකිය යුතු පාරිසරික බලපෑම් නිශ්චය කිරීම සඳහා, එවැනි ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හෝ වැඩසටහන්වලට අදාළ සංකල්ප පත්‍රිකාව සමඟ නිසිලෙස සම්පූර්ණ කරන ලද පාරිසරික වැදගත්කම පරීක්ෂා කිරීමේ ලැයිස්තුවක් අධිකාරියට භාරදිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා, "පාරිසරික වැදගත්කම පරීක්ෂා කිරීමේ ලැයිස්තුව" යන්නෙන්, යෝජිත ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් මගින් සිදු විය හැකි සැලකිය යුතු පාරිසරික බලපෑම් පිළිබඳ කරුණු රැස් කරන ප්‍රශ්නාවලියක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, යම් ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් (1) වන

උපවගන්තියේ විධිවිධාන යටතට ගැනෙන්නේ ද නැද්ද යන්න නොසලකා, සකස් කරනු ලබන හෝ සංශෝධනය කරනු ලබන එවැනි යම් ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හෝ වැඩසටහන් මගින් පරිසරයට සැලකිය යුතු බලපෑමක් ඇති විය හැකි බවට අමාත්‍යවරයාට පෙනී යන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ලිඛිත දැනුම්දීමක් මගින් ඒ ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හෝ වැඩසටහන් සකස් කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතනයට උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාවක් එම ප්‍රතිපත්තියේ, උපායමාර්ගයේ, සැලසුමේ හෝ වැඩසටහනේ කෙටුම්පතක් සමඟ සමාලෝචනය සඳහා සකස් කර භාරදෙන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් මගින් නියම කර ඇති පරිදි, උපාය මාර්ගික පාරිසරික ඇගැයීම් වාර්තාවක් සකස් කර එය එම ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හෝ වැඩසටහන්වල කෙටුම්පත සමග අධිකාරියට භාරදීම යම් රජයේ ආයතනයක කාර්ය විය යුතු ය. අධිකාරිය විසින් එම වාර්තාව සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, එහි නිර්දේශ හෝ සැලකිල්ලට ලක් වූ කරුණු නිශ්චිතව දැක්විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත භාරදෙන ලද උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාව ලැබුණු පසුව අධිකාරිය විසින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන පුවත්පතක පළ කරනු ලබන දැන්වීමක් මගින්, මහජනතාවට ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස ඒ වාර්තාව පරීක්ෂා කර බැලීමට හැකි ස්ථාන සහ වේලාවන් පිළිබඳ දැනුම් දිය යුතු ය. (4) වන උපවගන්තිය යටතේ නියම කරන ලද නියමයන්ට අනුකූලව භාරදෙන ලද උපාය මාර්ගික පාරිසරික

ඇගැයීම් වාර්තාවක්, (21 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ 74 වන සහ 76 වන වගන්තිවල කාර්යයන් සඳහා පොදු ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලබන දින සිට දින තිහක් ඇතුළත, මහජනතාව අතුරෙන් යම් තැනැත්තකුට ඒ වාර්තාව පිළිබඳ ඔහුගේ අදහස් ඇත්නම් ඒවා අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් මහජන අභිවෘද්ධිය උදෙසා සුදුසු යැයි සලකන අවස්ථාවක දී, එවැනි යම් තැනැත්තකුගෙන් ඔහුගේ අදහස් සනාථ කිරීමට උපකාර වන පරිදි එම අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය. එවැනි ප්‍රතිපත්ති, උපාය මාර්ග, සැලසුම් හෝ වැඩසටහන් සමාලෝචනයේ දී, එවැනි යම් කරුණු විමසීමක දී අනාවරණය කරගන්නා ලද අදහස් දැක්වීම් සහ වෙනත් යම් ලේඛන ඇත්නම් ඒවා සැලකිල්ලට ගත යුතු ය. ඉන් අනතුරුව අධිකාරිය විසින් අදාළ රජයේ ආයතනයට ලිඛිතව කරන ලද සමාලෝචනයක් මාර්ගයෙන් ස්වකීය සොයාගැනීම්, සැලකිල්ලට ලක්විය යුතු කරුණු සහ නිර්දේශ වාර්තා කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන සකස් කරන ලද රාජ්‍ය ආයතනය විසින් උපායමාර්ගික පාරිසරික ඇගැයීමේ සොයාගැනීම් සහ අධිකාරිය විසින් සකස් කරන ලද යම් සමාලෝචනයක සොයාගැනීම්, සැලකිල්ලට ලක් විය යුතු කාරණා සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින්, එම ප්‍රතිපත්තියේ, උපාය මාර්ගයේ, සැලසුමේ හෝ වැඩසටහනේ කෙටුම්පත සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කළ යුතු අතර, අධිකාරියේ තීරණවලට ප්‍රතිචාර වශයෙන් කෙටුම්පතට අදාළව සිදු කරන ලද යම් සංශෝධන හෝ වෙනස්කම් පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් සමඟ සංශෝධිත ප්‍රතිපත්තියෙහි, උපායමාර්ගයෙහි,

සැලසුමෙහි හෝ වැඩසටහනෙහි අවසාන වාර්තාව අධිකාරියට භාර දිය යුතු ය. ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන සකස් කරන ලද රාජ්‍ය ආයතනය විසින්, කෙටුම්පතට සිදු කරන ලද සංශෝධන හෝ වෙනස්කම් අධිකාරියේ නිර්දේශවලට වෙනස් වන්නේ නම් ලිඛිතව ඊට හේතු දැක්විය යුතු ය.

(8) අවස්ථාවෝචිත පරිදි, (6) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද, අධිකාරිය විසින් සමාලෝචනය කිරීමෙන් පසු කරන ලද සොයා ගැනීම්, එළඹුණු තීරණ, සැලකිල්ලට ගත යුතු කරුණු සහ නිර්දේශ සහ (7) වන උපවගන්තිය යටතේ දක්වා ඇති ලේඛන ඇතුළුව අවසාන ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන අධිකාරියෙහි වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(9) (7) වන උපවගන්තිය මගින් දක්වා ඇති ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු අධිකාරිය විසින් එහි අවසාන නිරීක්ෂණ සහ නිර්දේශ අදාළ රජයේ ආයතනයට භාරදිය යුතු ය.

(10) අවස්ථාවෝචිත පරිදි, (6) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද අධිකාරිය විසින් සිදු කරන ලද සමාලෝචනයක සොයාගැනීම්, සැලකිල්ලට ගත යුතු කරුණු සහ නිර්දේශ සහ (9) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛන ඇතුළුව අවසාන ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන අදාළ රාජ්‍ය ආයතනය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත හෝ ඒ ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන අනුමත කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වෙනත් යම් බලධරයකු වෙත භාර දිය යුතු ය.

(11) අමාත්‍ය මණ්ඩලය විසින් හෝ එම ප්‍රතිපත්තිය, උපාය මාර්ගය, සැලසුම හෝ වැඩසටහන අනුමත කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වෙනත් යම් බලධරයෙක් විසින්, එවැනි ප්‍රතිපත්තියක්, උපාය මාර්ගයක්, සැලසුමක් හෝ වැඩසටහනක් අනුමත කිරීම, නිකුත් කිරීම හෝ පිළිගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාව සහ අධිකාරියේ අවසාන නිරීක්ෂණ සහ නිර්දේශ සැලකිල්ලට ගත යුතු ය.

(12) (10) වන උපවගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කරන ලද අවස්ථාවක ඒ අනුමතය ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් පළවන එක් එක් පුවත්පතක පළ කරනු ලැබිය යුතු ය.

(13) යම් උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාවක් සමාලෝචනය කිරීම සඳහා “රහසිගත” ලෙස වර්ගීකරණය කර නොමැති යම් තොරතුරු සහ දත්ත යම් සාධාරණ කාලසීමාවක් තුළ සපයන ලෙසට අධිකාරිය විසින් යම් රාජ්‍ය ආයතනයකින් ඉල්ලා සිටිය හැකි ය. ඒ අනුව එම ආයතනය එම තොරතුරු සහ දත්ත ලබා දිය යුතු ය.

උපායමාර්ගික පාරිසරික ඇගයීම සඳහා වන නියෝග

**23ඔඕ.** අමාත්‍යවරයා විසින්, උපායමාර්ගික පාරිසරික ඇගයීමට අදාළ විධිවිධාන ක්‍රියාවට නැංවීම හෝ ඒවාට බලාත්මකභාවයක් ලබා දීම පිණිස පහත දැක්වෙන දේ ඇතුළත් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) 23ඔඔ වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි පාරිසරික වැදගත්කම පරීක්ෂා කිරීමේ ලැයිස්තුවේ ඇතුළත් කළ යුතු නිර්ණායක තීරණය කිරීම;

(ආ) උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාවල ව්‍යුහය සහ අන්තර්ගතය;

(ඇ) උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා වන ගාස්තු;

(ඈ) උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධ සමාලෝචන සහ තීරණ ගැනීමේ කාර්යයෙහිලා විනිවිදභාවය සහ මහජන සහභාගීත්වය;

(ඉ) උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය කරගෙන යාමේ දී අවශ්‍ය පියවර ගැනීමට ගත යුතු කාල සීමා;

(ඊ) තක්සේරු කරන ලද ප්‍රතිපත්තියකට, උපාය මාර්ගයකට, සැලසුමකට හෝ වැඩසටහනකට, උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාවේ යම් සමාලෝචනයක තීරණ, සැලකිල්ලට ගත යුතු කරුණු සහ නිර්දේශ ඇතුළත් කිරීම; සහ

(උ) ප්‍රතිපත්තියක, උපාය මාර්ගයක, සැලසුමක හෝ වැඩසටහනක ඇතුළත් කරන ලද තීරණ, සැලකිල්ලට ගත යුතු කරුණු සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

IV ඉ කොටස

**තෙත්බිම් සංරක්ෂණය**

තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම

**23කක.** අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇත්නම් මිස, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් -

(අ) වෙනත් යම් නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරන ලද, අර්ථ නිරූපණය කරන ලද හෝ කළමනාකරණය කරන ලද තෙත්බිම් බැහැර කරමින්, ආරක්ෂා කිරීම සඳහා සහ සංරක්ෂණය කිරීම සඳහා තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම; සහ

(ආ) එවැනි ප්‍රකාශයට පත් කරන ලද තෙත්බිම්වල අවසර දිය හැකි කටයුතු නිශ්චිතව සඳහන් කිරීම,

කරනු ලැබිය හැකි ය.

ප්‍රකාශිත තෙත්බිම් සංරක්ෂණය කිරීම

**23ගග.** (1) මේ පනතේ කාර්යයන් සඳහා, යම් ප්‍රකාශිත තෙත්බිමක් තුළ හෝ තෙත්බිමක් මත කිසිදු තැනැත්තකු විසින්, අවසර දිය හැකි කටයුත්තක් නොවන යම් කටයුත්තක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතය යටතේ හැර ආරම්භ කිරීම, කරගෙන යාම, නොකඩවා පවත්වාගෙන යාම හෝ අවසන් කිරීම නොකළ යුතු ය.

(2) අනුමතය සඳහා වන සෑම ඉල්ලීමක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් විය යුතු අතර, ඉල්ලුම් පත්‍රයේ කටයුතු කරගෙන යාම සඳහා වන නියමිත ගාස්තුවලින් සහ ඉල්ලුම්කරු අනුමත කොන්දේසිවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම සඳහා වන නියමිත ගාස්තුවලින් සමන්විත විය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින්, ඉල්ලුම් පත්‍රයේ කටයුතු කරගෙන යාමේ කාර්ය සඳහා යම් ලේඛනයක් භාරදීමට හෝ වැඩිදුරටත් වූ තොරතුරු ඉදිරිපත්

කිරීමට ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ අනුමතය ප්‍රදානය කරනු ලැබ ඇති කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් නිශ්චිතව සඳහන් කර ඇති යම් කොන්දේසිවලට යටත් විය යුතු ය.

තෙත් බිමක් තුළ අනුමතයකින් තොරව යම් කටයුත්තක් කරගෙනයාම වරදක් බව

**23ජජ.** (1) මේ කොටස උල්ලංඝනය කරමින්, ප්‍රකාශිත තෙත්බිමක් තුළ හෝ ඒ මත අනුමතයකින් තොරව යම් කටයුත්තක් කරගෙන යන හෝ යම් කටයුත්තක නිරතව සිටින හෝ නොකඩවා කරගෙන යන හෝ සම්පූර්ණ කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී-

(අ) රුපියල් මිලියන එකකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය; සහ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්දේශ කරන ලද කොන්දේසිවලට අනුකූල වන ලෙස සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වෙන පරිදි තෙත් බිම යථා තත්ත්වයට පත් කරන ලෙසට නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ඒ උපවගන්තිය

යටතේ අධිකරණය විසින් නියම කරන ලද යම් කාලසීමාවක් තුළ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්දේශ කරන ලද කොන්දේසිවලට අනුකූල නොවෙමින් එම කටයුත්ත අඛණ්ඩව කරගෙන යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ඉල්ලීමක් මත, ඒ තැනැත්තා ඒ නිර්දේශවලට අනුකූල වන තෙක්, යම් කටයුත්තක් නවතා දැමීමට හෝ අවසන් කිරීමට හෝ නියෝග කරනු ලැබිය යුතු ය.

IV ඊ කොටස

**නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම**

නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම් යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම

**23ටට.** (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ස්වාධීනව හෝ වෙනත් යම් තැනැත්තකු සමග කරගෙන යා යුතු, නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම ක්‍රියාත්මක කිරීමට යටත් වන භාණ්ඩ හෝ නිෂ්පාදන පිළිබඳව නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) යම් භාණ්ඩයක් හෝ නිෂ්පාදනයක් ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතය හෝ බැහැර කිරීම ලෙස හෝ වෙනත් යම් ආකාරයකින් අවසන් බැහැර කිරීම සිදු කරන තෙක්, එවැනි භාණ්ඩයක හෝ නිෂ්පාදනයක ආනයනකරු, නිෂ්පාදකයා, අලෙවිකරු, හසුරුවන්නා සහ පාරිභෝගිකයා විසින් එවැනි භාණ්ඩ හෝ නිෂ්පාදනයක ජීවන චක්‍ර කළමනාකරණය සඳහා වගකිව යුතු බව නියම කෙරෙන නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම අනුගමනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා විසින් නියෝග මගින් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පිහිටුවනු ලැබිය හැකි ය. වගකිව යුතු පාර්ශ්වයෙන් ගාස්තුවක් අය කරන ආකාරය සහ

කාර්යපටිපාටිය සහ යාන්ත්‍රණයේ යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූල නොවීම සඳහා අයකරන ගාස්තුව යාන්ත්‍රණයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කරන ලද යම් භාණ්ඩයක හෝ නිෂ්පාදනයක සියලු ආනයනකරුවන්, නිෂ්පාදකයන්, අලෙවිකරුවන්, හසුරුවන්නන් සහ පාරිභෝගිකයන් (2) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද යාන්ත්‍රණයේ නියම සහ කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

(4) යම් තැනැත්තකු යාන්ත්‍රණයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි ගාස්තුවක් ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු පැවරීමක් මාර්ගයෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයකට සහ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(6) මේ කොටසේ කාර්ය සඳහා -

"නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම" යන්නෙන්, භාණ්ඩයක

නිෂ්පාදකයාගේ වගකීම එම භාණ්ඩයේ ජීවන චක්‍රයේ පශ්චාත් පාරිභෝගික අවධිය දක්වා විස්තාරණය කරන ලද පාරිසරික කළමනාකරණ ප්‍රවේශයක් අදහස් වේ;

"නිෂ්පාදකයා" යන්නෙන්, නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, වෙනස් කිරීම, විකිණීම හෝ නැවත විකිණීමේ අවසරලත් ක්‍රම භාවිත කරමින් හෝ අන්‍යාකාරයෙන් භාණ්ඩ, නිෂ්පාදන සහ ඇසුරුම්කරණය රටට හඳුන්වාදෙන අස්තිත්වයක් අදහස් වේ.

IV උ කොටස

**වැරදි සහ දණ්ඩන**

පොදු දණ්ඩන

**23ඩඩ.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට පටහැනිව කටයුතු කරන, හෝ ඒ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ පනතට අනුකූලව ක්‍රියා කරන යම් තැනැත්තකුට බාධා කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරුවකු විය යුතු ය. අධිකරණ බලය පවතින මහෙස්ත්‍රාත් අධිකරණයක දී නඩු පවරනු ලැබීමේ දී, මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ ප්‍රකාශිතව දණ්ඩනයක් සලසා නොමැති වරදකට වරදකරු යයි සොයාගන්නා යම් තැනැත්තකු රුපියල් දෙලක්ෂ පනස්දහසකට නොඅඩු සහ රුපියල් මිලියන පහළොවකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ

බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

පරිසරයට වන හානි ආදිය යථා තත්ත්වයට පත් කිරීම හෝ අවම කිරීම

**23ණණ.** (1) නියමිත හෝ නියම නොකරන ලද යම් කටයුත්තකින් හෝ ව්‍යාපෘතියකින් පරිසරයට යම් උපද්‍රවයක්, හානියක් හෝ දූෂණයක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ඉල්ලීමක් මත වරදකරු කරනු ලැබීමට පෙරාතුව මහෙස්ත්‍රාත්වරයා විසින්, එවැනි හානියක්, උපද්‍රවයක් හෝ දූෂණයක් සඳහා යම් නිවැරදි කිරීමේ පියවර ගැනීමට වගකිවයුතු යම් තැනැත්තකු වෙත, සුදුසු යැයි සලකනු ලබන ආඥාවක් කරනු ලැබිය හැකි ය. මහෙස්ත්‍රාත්වරයා විසින් එවැනි උපද්‍රව, හානි හෝ දූෂණ සලකා බලමින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාලසීමාවක් තුළ පරිසරය එය පැවති මුල් තත්ත්වය දක්වා යථා තත්ත්වයට පත් කරන ලෙසට හෝ එකී හානිය සිදු වී ඇති ප්‍රදේශයේ හානිය අවම කරන ලෙසට ඒ සඳහා වගකිව යුතු තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 23ඉ හෝ 23ඇඇ වගන්තිවලට යටත්ව කරනු ලැබිය යුතු ය. ඒ ඉල්ලීම ගොනු කිරීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින් වැඩ කරන දින තුනක් ඇතුළත ඒ ඉල්ලීම පිළිබඳව කටයුතු කරනු ලැබිය යුතු අතර, සති දෙකක කාලයක් ඇතුළත නියෝගයක් දීමට කටයුතු කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ආඥාව කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් පරිසරය යථා තත්ත්වයට පත් කිරීමට හෝ හානිය අවම

කිරීමට සහ තවදුරටත් පරිසරයට සිදු විය හැකි යම් හානියක් වැළැක්වීමට ගෙන ඇති පියවර සනාථ කිරීමේ ලේඛන අධිකරණයට භාරදිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින්, වරදේ ස්වභාවය සහ සිදුවී ඇති හානියේ හෝ දූෂණයේ ප්‍රමාණය අනුව යම් කටයුත්තක හෝ ව්‍යාපෘතියක ක්‍රියාකාරීත්වය මහෙස්ත්‍රාත්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් කාලසීමාවකට, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවකට අනුකූල වන තෙක්, අත්හිටුවනු ලැබිය හැකි ය.

(5) තමා වෙත භාරදෙන ලද, ගනු ලැබූ පියවර පිළිබඳ සාක්ෂි සම්බන්ධයෙන් සෑහීමට පත්වන අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිත ප්‍රකාශයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, නඩුව අවසාන කරනු පිණිස එය අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වන ආඥාවක් කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා පරිසරය යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රමාණවත් නිවැරදි කිරීමේ පියවර ගැනීම ප්‍රායෝගික නොවන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය සිදු කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය. අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් සහ පිරිවැය ගෙවන ලෙස අධිකරණය විසින් එකී වගකිව යුතු තැනැත්තාට ආඥා කරනු ලැබිය යුතු ය. එවැනි වියදම් සහ පිරිවැය අධිකරණය විසින් පනවන ලද දඩයක් සේ අයකර ගනු ලැබිය යුතු ය. අධිකරණය විසින් ඊට අමතරව, අත්‍යවශ්‍ය යැයි අධිකරණය විසින් සලකනු ලබන, පසුව ඇති විය හැකි වියදමක් පිළිබඳ ව අවශ්‍ය විය හැකි පරිදි වූ ආඥාවක් කරනු ලැබිය හැකි ය.”.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ලේඛනවල පිටපත් ගැනීම; හෝ" යන වචන වෙනුවට "ලේඛනවල පිටපත් ගැනීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්: -

"(ඊ) යම් වෙළඳාමක්, ක්‍රියාවලියක්, කර්මාන්තයක් හෝ කටයුත්තක් කරගෙන යමින් තිබෙන හෝ කරගෙන ගොස් තිබෙන යම් ඉඩමක් හෝ පරිශ්‍රයක් පරීක්ෂාකර සෝදිසි කිරීම සහ එයට අදාළ ඉලෙක්ට්‍රොනික හෝ අනාකාරයේ වාර්තා, පොත් සහ ලේඛන පරීක්ෂා කිරීම සහ ඒවායේ වාර්තා තබා ගැනීම සහ අවශ්‍ය වන්නේ නම් ඒවායෙහි සාම්පල, වීඩියෝ සහ ඡායාරූප ගැනීම; හෝ

(උ) මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු පරීක්ෂා කිරීම්, සෝදිසි කිරීම් හෝ වෙනත් සත්‍යාපන සිදු කිරීම.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 24අඅ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට 24අඅ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

“අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ඉල්ලීමක් රාජ්‍ය දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය සංස්ථාවකට යොමු කළ හැකි බව

**24අඉ.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව නිසි ලෙස බලය පවරන යම් නිලධරයකු විසින්, පරිසරයට වන හානිකර ප්‍රතිවිපාක පිළිබඳ වාර්තාවක් ඉල්ලා සිටිමින් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත යම් කාරණයක් යොමු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක දී, පරිසරයට සිදුවන හානිකර ප්‍රතිවිපාක සම්බන්ධ වාර්තාවක් ඒ දෙපාර්තමේන්තුවෙන් හෝ සංස්ථාවෙන් ඔවුන් වෙත ලැබෙන තෙක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිසි ලෙස ලිඛිතව බලය පවරන ලද යම් නිලධරයකු විසින් ඒ ඉල්ලීම පිළිබඳව කිසිදු තීරණයක් ගැනීම සිදු නොකළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24ආ වගන්තිය සංශෝධනය කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ආ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

“(3) මේ වගන්තියේ විධිවිධාන IVඅ කොටස, IVඅඅ කොටස, IVඅආ කොටස සහ IVඅඇ කොටස යන කොටස්වල නිශ්චිතව සඳහන් කර ඇති නියමිත කටයුතුවලට අදාළ කරගනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 24ආඅ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 24ආඅ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය: -

“පරිසරයට හානිකර අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම

**24ආඅ.** (1) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදුකරන ලද යම් ඉදිකිරීමක් හේතුවෙන් මහජන පීඩාවක් පවතින බවට හෝ පරිසරයට යම් තර්ජනයක්, හානියක් හෝ පීඩාවක් සිදුවී ඇති බවට හෝ සිදුවීමට ඉඩ තිබෙන බවට-

(අ) අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ මතය වන විට; හෝ

(ආ) මහජනතාව අතරින් සාමාජිකයකුගෙන් ලිඛිතව පැමිණිල්ලක් ලැබුණු පසු සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරණාව පරීක්ෂා කිරීමෙන් පසු ඔහුගේ මතය වන විට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකරණ බලය පවතින මහෙස්ත්‍රාත්වරයාට එවැනි ඉදිකිරීමක් කඩාබිඳ හෙළීමට නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කඩා බිඳ හෙළීමේ නියෝගයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම 23ඉ වගන්තිය හෝ 23ඇඇ වගන්තියට යටත් විය යුතු අතර, ඉල්ලීමට අදාළ සියලු කරුණු ගෙන හැර දක්වන්නා වූ, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් යුත් සහතිකයකින් සමන්විත විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහතිකය සාක්ෂිවල දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු අතර එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද ඉල්ලුම් පත්‍රයේ සහ සහතිකයේ අඩංගු කාරණා පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින් ඉහත කී අනවසර ඉදිකිරීම් කඩා බිඳහෙළීමට ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) එවැනි ආඥාවක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත ඒ ඉදිකිරීම කඩා බිඳ හෙළීමට කටයුතු කිරීම, ඒ ආඥාව යොමු කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගේ වගකීම විය යුතු අතර, ඒ කඩා බිඳහෙළීම පිළිබඳව අධිකාරියට දැනුම් දිය යුතු ය.

(5) ඉදිකිරීමක් කඩා බිඳහෙළීමේ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට එවැනි තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් නොපමාව ඒ ආඥාව නිකුත් කළ දින සිට පූර්ණ දින තුනකට කලින් හෝ දින හතකට පසුව එන දිනයක් නොවන ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙරාතුව, එවැනි ඉදිකිරීමක් කඩා බිඳහෙළීමට අධිකරණයේ පිස්කල්වරයාට ආඥා කරනු ලැබිය යුතු ය. එවැනි ආඥාවක් අධිකරණයේ පිස්කල්වරයාට හෝ තත්කාර්ය සඳහා සහාය වීමට මහෙස්ත්‍රාත්වරයා විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකුට පරිශ්‍රයට ඇතුළුවීමට සහ ඒ ආඥාව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අධිකාරයක් විය යුතු ය.

(6) අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට, පරිසරයට සිදුකළ හානි යථා තත්ත්වයට පත් කිරීමට සහ එවැනි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කර ගැනීම සම්බන්ධ ප්‍රමාණවත් සහ පිළිගතහැකි සාක්ෂි අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට, වගකිවයුතු තැනැත්තා වෙත අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

"(3) (1) වන උපවගන්තිය යටතේ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරන ලද යම් ප්‍රදේශයක් තුළ, 24ඇ සහ 24ඈ වගන්ති යටතේ සාදන ලද නියෝගයක් උල්ලංඝනය කරමින් යම් කටයුත්තක් සිදුකරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇඅ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය: -

ප්‍රධාන ප්‍රඥප්තියට 24ඇඅ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"ස්වභාවික සම්පත්වලට සිදු වූ අලාභය ආදිය තක්සේරු කිරීම සහ හානිපූරණය

**24ඇඅ.** (1) කිසිදු තැනැත්තකු විසින් පරිසරයේ යම් ස්වභාවික සම්පතකට හානියක් හෝ උපද්‍රවයක් සිදුකිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) දූෂණයට හේතුවන බැහැරි ද්‍රව්‍ය මුදාහරිමින් හෝ යම් කටයුත්තක් හෝ ව්‍යාපෘතියක්, ඒ කටයුත්ත හෝ ව්‍යාපෘතිය මේ පනත යටතේ නියම කරනු ලැබ තිබුණත් නැතත්, එවැනි යම් කටයුත්තක් හෝ ව්‍යාපෘතියක් මගින් යම් හානියක් හෝ උපද්‍රවයක් සිදුකරනු ලැබ ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් ප්‍රමාදයකින් තොරව සිදුව ඇති එවැනි හානි හෝ උපද්‍රවවල පිරිවැය තක්සේරු කරනු ලැබිය යුතු අතර, වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් ඒ පිරිවැය අයකර ගැනීමට කටයුතු කරනු ලැබිය යුතු ය. හානිය හෝ උපද්‍රවය තක්සේරු කිරීම සඳහා වන වියදම වගකිව යුතු පාර්ශ්වය විසින් දරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි හානි හෝ උපද්‍රවවල පිරිවැය තක්සේරු කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකු විසින් අදාළ ක්ෂේත්‍රවල යම් දේශීය හෝ විදේශීය විද්වතුන්ගේ සහාය ලබාගත හැකි ය.

(4) අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු කටයුත්තක් පැවරීම මගින් වගකිව යුතු තැනැත්තන්ගෙන් ඒ මුදල් අයකර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකුට බලය තිබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ හානියක් හෝ උපද්‍රවයක් තක්සේරු කිරීමේ පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින්, පරිසරය එහි පැවති තත්ත්වයෙන් ම යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය යම් නිවැරදි කිරීමේ පියවර ගැනීමට සහ තවදුරටත් වන යම් හානියක් හෝ උපද්‍රවයක් වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්වාරක්ෂක පියවර ගැනීම සඳහා වගකිව යුතු තැනැත්තාට නියෝග කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු අලාභ හානිය, එය සිදු වීමට පෙර පැවති මුල් තත්ත්වයෙන් ම යථා තත්ත්වයට පත්කිරීමට නොහැකිය යන මතයේ සිටින අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් තීරණය කරනු ලැබිය යුතු පිළිගත හැකි මට්ටමකට ඒ හානිය හෝ උපද්‍රවය පිළිසකර කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයා

විසින් වගකිව යුතු පාර්ශ්වයන්ට නියෝග කරනු ලැබිය යුතු ය. වගකිව යුතු තැනැත්තා විසින් පරිසරය එය පැවති මුල් තත්ත්වයෙන්ම යථා තත්ත්වයට පත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් වගකීම් ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද මුදල සහ අධිකාරිය විසින් එකතු කරන ලද වගකීම් ගාස්තුව 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, බලපෑමට ලක් වූ පරිසර පද්ධති සහ බලපෑමට ලක් වූ පාර්ශ්වයන් කළමනාකරණය වෙනුවෙන් එය පවත්වාගෙන යා යුතු ය.

(7) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද මුදල සහ (5) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද වගකීම් ගාස්තුව ගෙවීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, අධිකරණ බලය සහිත මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී රුපියල් මිලියන එකකට නොඅඩු සහ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්ය සඳහා “පරිසර පද්ධතිය” යන්නෙන් පාරිසරික ඒකකයක් ලෙස අන්‍යෝන්‍යව ක්‍රියාකරන ජෛව ප්‍රජාවක් සහ ඔවුන්ගේ භෞතික පරිසරය අදහස් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24ඇ වන වගන්තියේ (4) වන උපවගන්තියේ “24 වන වගන්තිය යටතේ වූ නියෝගයක්” යන වචන සහ ඉලක්කම් වෙනුවට “24ඇ වගන්තිය යටතේ වූ නියෝගයක්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

“ අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**27.** අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් -

(අ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය වෙනුවෙන් රජයේ සේවකයන් ලෙස; සහ

(ආ) මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස,

සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 27අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 27අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය: -

“ මේ පනතේ IV ආ කොටස යටතේ වන සියලු වැරදි සංඥෙය වැරදි ලෙස සලකනු ලැබිය යුතු බව

**27අ.** මේ පනතේ IVආ කොටස යටතේ වන සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් උදෙසා සංඥෙය වැරදි ලෙස සලකනු ලැබිය යුතු ය.”.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ: -

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**28.** අධිකාරිය 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.".

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ඉවත් කිරීම

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 31අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය: -

ප්‍රධාන ප්‍රඥප්තියට 31අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**31අ.** මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරන ලද අවස්ථාවක දී, එවිට ඒ පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ වෙනත් ප්‍රධාන නිලධරයකුම ; හෝ

(ආ) ආයතනයක් වේ නම් ඒ ආයතනයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් වේ නම්, ඒ මණ්ඩලයේ පාලක සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම සහ පුද්ගල

මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය වෙනුවෙන් වගකියන ඒ මණ්ඩලයේ සෑම ප්‍රධාන නිලධරයකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනීමකින් තොරව බවටත්, ඒ වරද සිදු කිරීම වැළැක්වීමට ඔහු නිසි උද්යෝගයෙන් ක්‍රියාකර ඇති බවටත් ඔහු විසින් ඔප්පු කරන්නේ නම් කිසිදු තැනැත්තකු එවැනි වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(ඈඅ) රසායනික ද්‍රව්‍යවල අන්තරායකාරී බලපෑම්වලින් මානව සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින්, අන්තරායකර ද්‍රව්‍ය භාවිතය සීමා කිරීම හෝ ඇතැම් අන්තරායකර ද්‍රව්‍ය තහනම් කිරීම සහ පරිසරයට සහ මිනිසාගේ සෞඛ්‍යයට හානිකර එවැනි ද්‍රව්‍යයක් හෝ යම් රසායන ද්‍රව්‍ය ආනයනය, නිෂ්පාදනය, සකස් කිරීම, නැවත ඇසුරුම් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය, විකිණීම සහ භාවිතය ලියාපදිංචි කිරීම හෝ අධීක්ෂණය කිරීම.”;

(2) ඒ උපවගන්තියේ (ට) ඡේදයේ “ද්‍රව්‍ය බැහැර කිරීම; සහ” යන වචන වෙනුවට “ද්‍රව්‍ය බැහැර කිරීම;”යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ඩ) ඡේදයේ “නියම කිරීම” යන වචන වෙනුවට “නියම කිරීම; සහ” යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ උපවගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

“(ණ) පරිශ්‍ර නිෂ්කාශන වාර්තාව ඉල්ලුම් කිරීමේ කාර්යපටිපාටිය සහ අදාළ ගාස්තු.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම**

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(1) “වායු දූෂණය” යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

“කටයුත්ත” යන්නට, තාවකාලිකව හෝ ස්ථිරව පාරිසරික උපද්‍රවවලට බලපාන වාණිජමය හෝ වාණිජමය නොවන ස්වභාවයෙන් යුත් සංවර්ධන ව්‍යාපෘතියක්, යෝජනා ක්‍රම, පහසුකම්, කර්මාන්ත, වෙළඳාම්, ව්‍යාපාර, අන්තර් භුවමාරු පහසුකම් හෝ වෙනත් යම් ව්‍යවසායයන් ඇතුළත් වේ;”;

(2) “වායු දූෂණය” යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

“සභාපතිවරයා” යන්නෙන්, 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ;

“රසායන ද්‍රව්‍ය” යන්නට, අන්තරායකර රසායන ද්‍රව්‍ය ඇතුළත් වේ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 13 වන වගන්තිය යටතේ සඳහන් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;";

(3) "අනන්‍ය ආර්ථික කලාපය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"රජයේ ආයතන" යන්නෙන්, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, ව්‍යවස්ථාපිත අධිකාරියක්, පළාත් සභාවක්, පළාත් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් යම් පළාත් ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ සංස්ථාවක් හෝ සමාගමක් අදහස් වේ.";

"භූගත ජලය" යන්නෙන්, වර්ෂාවෙන් ආරම්භ වන සහ ජලධාරක, උල්පත්, ළිං සඳහා ජල මූලාශ්‍ර වන, පසේ අවසාදිතයේ හෝ ගල්වල ජලය ගලායන අවකාශවල පිරී ඇති, පොළොව යට මතුපිටට එක්රැස් වන හෝ ගලා යන ජලය අදහස් වේ;

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" හෝ "උපද්‍රවකාරී ද්‍රව්‍ය" යන්නෙන්, මහජන සෞඛ්‍යයට, සජීවී ජීවීන්ට, ද්‍රව්‍යවලට, පද්ධතිවලට හෝ පරිසරයට අනතුරක් සිදු කිරීමට මුල් විය හැකි ඝන, අර්ධ ඝන, ද්‍රව හෝ වායුමය ආකාරයේ යම් අපද්‍රව්‍යයක් අදහස් වේ;

“කාර්මික අනතුර” යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි පරිසරයට දූෂණයක් සිදු වීමට හේතුවන කාර්මික අනතුරක් අදහස් වේ;

“දේශීය ජල තීරය” යන්නට, දේශීය මතුපිට ජල තීරය, භූගත ජල තීරය සහ ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය ඇතුළත් වේ;”;

(4) “පළාත් පාලන ආයතනය” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

“අමාත්‍යාංශය” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පරිසර විෂයය පවරනු ලැබ ඇත්තේ යම් අමාත්‍යාංශයකට ද ඒ අමාත්‍යාංශය අදහස් වේ;

“අධීක්ෂණය” යන්නෙන්, අනෙකුත් අස්තිත්වයක් සමග සම්බන්ධීකරණයෙන් හෝ එහි නිපුණතාවය තුළ, අධිකාරිය විසින් භාරගනු ලබන යම් ක්‍රියාවලියක් අදහස් වන අතර, ඊට ස්ථාන පරීක්ෂාව, පිරික්සා බැලීම, අත්හදා බැලීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා එක් රැස් කිරීම සහ පවත්වාගෙන යාම, ගිවිසුම් ලියා අත්සන් කිරීම හෝ අදාළ බලධරයන් විමසා අලුත් කිරීමේ ක්‍රියාපටිපාටි සකස් කිරීම ඇතුළත් වේ;”;

(5) “ශබ්ද දූෂණය” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

“වගකිව යුතු තැනැත්තා” යන්නෙන්, පරීක්ෂාකාරී වීමට ඇති කාර්ය ඕනෑකමින් පැහැර හැරීම නිසා හෝ අහඹු ලෙස ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළ යම් දූෂණ කාරකයක් මුදා හැරීමක්,

නිකුත් කිරීමක් හෝ තැන්පත් කිරීමක් සිදු කරන හෝ පරිසරයට හානියක් සිදු කරන යම් කටයුත්තක් භාර ගෙන ඇති, දේශීය හෝ විදේශීය වශයෙන් සංස්ථාපිත කරන ලද හෝ සංස්ථාපිත නොකරන ලද තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;'';

(6) ''දූෂණ කාරකය'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ ''දියර, ඝන හෝ වායු වන්නා වූ යම් මූලද්‍රව්‍යයක් අදහස් වේ;'' යන වචන වෙනුවට ''දියර, ඝන හෝ වායු වන්නා වූ යම් මූලද්‍රව්‍යයක් නැතහොත් බලශක්තියක් අදහස් වේ;'' යන වචන ආදේශ කිරීමෙන්;

(7) ''දූෂණය'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ ''පිට කිරීමෙන් හෝ බහා තැබීමෙන් පරිසරයේ'' යන වචන වෙනුවට ''පිට කිරීමෙන්, බහා තැබීමෙන් හෝ භූ හෝ වායු කම්පනය මගින් පරිසරයේ'' යන වචන ආදේශ කිරීමෙන්;

(8) ''නියමිත'' යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

''පරිශ්‍ර නිෂ්කාශන වාර්තාව'' යන්නෙන්, නියමිත කටයුත්ත සඳහා යෝජිත ස්ථානය සහ එහි පාරිසරික වටපිටාව සුදුසු තත්ත්වයක පවතින්නේ ද නැද්ද යන බවට පාරිසරික තුලනය සලකා බලන ලේඛනයක් අදහස් වේ;

''උපායමාර්ගික පාරිසරික ඇගැයීම'' යන්නෙන්, තිරසාර සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ආර්ථික සහ සමාජ කරුණු සමුච්ඡිත ලෙස සලකා බලමින් යම් යෝජිත ප්‍රතිපත්තියක, උපාය මාර්ගයක, සැලසුමක හෝ වැඩසටහනක විභව පාරිසරික බලපෑම් ඇගැයීමේ සහ එවැනි කරුණු, තීරණ ගැනීමේ

මුල්ම අදියරවලදී සුදුසු ලෙස සලකා බැලීමේ ක්‍රමානුකූල ක්‍රියාවලියක් අදහස් වේ;

“උපායමාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාව” යන්නෙන්, තිරසාර සහ ප්‍රත්‍යාස්ථ සංවර්ධනයක් අරමුණු කරමින්, පරිසරය වෙත සිදුවන අහිතකර ප්‍රතිවිපාක මුලිනුපුටා දැමීම හෝ අවම කිරීම සඳහා පරිසර හිතකාමී විකල්ප පියවර පිළිබඳ විශ්ලේෂණයක් සමඟ, කෙටුම්පත් අවස්ථාවේ පවතින යම් ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් සහ වැඩසටහන්වල පුරෝකථනය කරන ලද සැලකිය යුතු පාරිසරික බලපෑම් පිළිබඳ ලිඛිත විශ්ලේෂණයක් අදහස් වේ;”;

(9) “විෂ රසායන ද්‍රව්‍ය” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

“කම්පනය” යන්නෙන්, කම්පන තරංග ඇති කරන ඝන හෝ ද්‍රව මාධ්‍යයක් තුළින් ගමන් කරන ප්‍රත්‍යාස්ථ මාධ්‍යයක අංශුවල වරින්වර සිදුවන දෝලනයක් හෝ චලිතයක් අදහස් වේ;

“තෙත්බිම” යන්නෙන්, ස්වභාවිකව හෝ කෘත්‍රිමව, ස්ථිරව හෝ තාවකාලිකව රැඳී තිබෙන්නා වූ හෝ ගලා යන්නා වූ මිරිදිය, කිවුල් දිය හෝ කරදිය ඇති, බාදිය මට්ටමේ සිට ගැඹුරින් මීටර් හයක් නොඉක්මවන මුහුදු ජලය ද ඇතුළුව, වගුරු, ගොහොරු, පීට් ඉඩම් හෝ ජලය සහිත වූ ප්‍රදේශයක් අදහස් වේ.”

**42.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව